# මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීම් වාර්තාව

2025.09.19 වන දින ප.ව. 02.00 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රධාන කාර්යාලයේ රැස්වීම් ශාලාවේදී පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරකසභා රැස්වීමේදී ගරු සභාපතිතුමා විසින් කාරකසභා සාමාජිකයන් පිළිගැනීමෙන් අනතුරුව කාරකසභා අනුමැතිය ලබාගැනීම සඳහා විෂයභාර නිලධාරීන්, බාහිර ආයතන හා පුද්ගලයන් විසින් ඉදිරිපත් කල ගෙවීම් වවුචර්පත් හා ලිපි ලේඛන පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව එම ගෙවීම් වවුචර්පත් හා ලිපි ලේඛන සම්බන්ධයෙන් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරකසභාව විසින් ලබාගත් තීරණ පහත පරිදි වේ.

## තීරණ අංක 01

2025 පළාත් පාලන සතියට සමගාමීව පරිසර දිනයේදී පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන සහ රුක්රෝපණ වැඩසටහන සඳහා ලබාගත් රු.80,000.00 ක අත්තිකාරම් පියවීමේ වවුචර් පත ප්‍රජාසංවර්ධන නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම අත්තිකාරම් පියවීමට කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී.

## තීරණ අංක 02

පළාත්පාලන ආයතනවල ආදායම් සහ බදු අයකිරිම පිළිබද දෙදින පුහුණු වැඩමුළුව සඳහා ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු ආදායම් පරික්ෂක සිසිර කුමාර මහතා යොමු කරන ලෙස ඉල්ලා විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය පිළිබඳ ව සලකා බැලීමෙන් අනතුරුව ඒ සඳහා සහා අරමුදලින් පුහුණු ගාස්තු වශයෙන් රු.7000.00ක් මුදල ගෙවා සිසිර කුමාර මහතා යොමු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී.

**තීරණ අංක 03**

පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් වාරික ගෙවීමට අදාලව ,විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලදුපත් අංක 157 යටතේ 2025 අප්‍රේල් ,මැයි,ජුනි මාසවලට අදාලව වාරික මුදල් ගෙවීම සම්බන්ධව සකසන ලද ලිපිය කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පහත සඳහන් ගෙවීම් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී

| අනු අංකය | මාසය | වාරික |
|---|---|---|
| 01 | 2025 අප්‍රේල් | 9176.81 |
| 02 | 2025 මැයි | 9176.81 |
| 03 | 2025 ජුනි | 9176.81 |
| | එකතුව | 27530.43 |

**තීරණ අංක :- 04**

ප්‍රාදේශිය සභාවේ සෞඛ්‍ය කම්කරු එස්.ඒ.එස්.වික්‍රමතිලක මහතාගේ වාහන පැදවීමේ යෝග්‍යතාව පරික්ෂාකරදෙන ලෙසට ප්‍රාදේශිය සභාව මගින් කරන ලද ඉල්ලීමකට අනුව වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය මගින් එවා ඇති රියදුරු ප්‍රයෝගික පරික්ෂණයේ ප්‍රතිඵල ලේඛනයට අනුව සෞඛ්‍ය කම්කරු එස්.ඒ.එස්.වික්‍රමතිලක මහතා රියදුරු ආවරණය සඳහා යෙදවීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී

**තීරණ අංක 05**

2025.09.15 දින සිට 2025.09.21 දින දක්වා යෙදී ඇති පළාත් පාලන සතියට සමගාමීව ක්‍රීඩාව සඳහා තරුණ ප්‍රජාව තුළ උනන්දුවක් ඇති කිරීමේ අරමුණින් ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ලියාපදිංචි සියළුම යෞවන සමාජ සඳහා වොලිබෝලයක් හා දැලක් ලබාදීම සඳහා රු. 1,110,000.00 ක මුදලක් වැය දැරිම සඳහා අනුමැතිය පිණිස ඉදිරිපත් කරන ලිපිය, ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය විසින් කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වොලිබෝලයක් හා දැලක් ලබාදීම හා ඒ සඳහා රු 1,110.000.00 ක මුදල සභා අරමුදලින් වැයදැරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී .

## තීරණ අංක 06

2025.09.15 දින සිට 2025.09.21 දින දක්වා යෙදී ඇති පළාත් පාලන සතියට සමගාමීව 2025.09.20 දිනට නියමිත ක්‍රිකට් තරඟාවලිය සඳහා සහභාගී වන පිරිස සහ සහභාගී වන විනිසුරුවන් සඳහා සංග්‍රහ කටයුතු වෙනුවෙන් ආහාර සපයා ගැනීමට අදාලව සකසන ලද ලිපිය ප්‍රජාසංවර්ධන නිලධාරිතුමිය විසින් කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම ආහාර සපයාගැනීමට අවසර ලබාදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී .

ආහාර සම්බන්ධ විස්තරය පහත පරිදි වේ.

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | සැන්විච් | 50 |
| 02. | බේක් පැටිස් | 50 |
| 03 | කේක් | කිලෝ 2 |
| 04. | කෙසෙල්(කෝලිකුට්ටු) | ගෙඩි 50 |
| 05 | කිරි පිටි | කිලෝ 01 |
| 06 | සීනි | කිලෝ 1.5 |
| 07 | තේ කුඩු | ග්‍රෑම් 100 |
| 08 | පේපර් සර්වියට් | පැකට් 01 |
| 09 | බීම | ලීටර් 02 |
| 10 | කිරි පැකට් | පැකට් 06 |

## තීරණ අංක 07

කොට්ඨාස 25 ක් නියෝජනය කරමින් ක්‍රීඩා කණ්ඩායම් 25ක් සඳහා අන්තර් කොට්ඨාස සුහද වොලිබෝල් තරඟාවලිය සඳහා වන රු. 255,000.00 වියදම් ඇස්තමේන්තුව ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය විසින් කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රු.255.000.00 ක මුදල සභා අරමුදලින් වැයදැරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී .

| අනු අංකය | විස්තරය | ඒකකයක මිල | ප්‍රමාණය | එකතුව |
|---|---|---|---|---|
| 01 | 1 වන ස්ථානය,මුදල් ත්‍යාගය | | | 75,000.00 |
| 02 | 2 වන ස්ථානය, මුදල් ත්‍යාගය | | | 50,000.00 |
| 03. | වොලිබෝල් ක්‍රීඩාපිටිය සකස් කිරීම හා ක්‍රීඩා උපකරණ | | | 50,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | මිලදී ගැනීම | | | |
| 04 | විනිශ්වය මණ්ඩල දීමනාව | 5000.00 | 10 | 50,000.00 |
| 05 | නිවේදන කටයුතු සඳහා | 5000.00 | 02 | 10,000.00 |
| 06 | වෙනත් වැය දැරීම | | | 20,000.00 |
| මුළු එකතුව | | | | 255,000.00 |

## තීරණ අංක 08

2025.09.15 දින සිට 2025.09.21 දින දක්වා යෙදී ඇති පළාත් පාලන සතියට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පිරිණැමීමට නියමිත වොලිබොලය සහ දැලක් ලබා ගැනීම සඳහා සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් ලබා දි ඇති ඇස්තමේන්තුව සහිත ලිපිය කාරක සභාවට ඉදිරිපත් කිරිමෙන් අනතුරුව ,එම මිල ගණන් යටතේ රජයේ වාණිජ නීතිගත සංස්ථාව මගින් එම උපකරණ ලබා ගැනීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී .

## තීරණ අංක 09

ඔග්ගමුව වසමේ හකුරුකැටියාව පාර,පොල් කොටුව වත්ත පාර,වැව කෙලවර පාර,(ජේ.එම්.මහින්ද මහතාගේ නිවස ඉදිරිපිට පාර),කුඩාගල්ගමුව පාසල අසල සිට ඔග්ගමුව දක්වා දිවෙන මාර්ගය අවසන් කොටස යන මාර්ගයන් මෝටර් ග්‍රේඩරයක් දමා කපා බොරළු දමා තලා පිලිසකර කරදෙනමෙන් ඔග්ගමුව එකමුතු සංවර්ධන සමිතියෙන් ඉදිරිපත්කර ඇති ලිපිය කරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම මාර්ගයන් මොටර් ග්‍රේටර් කිරීම පමණක් සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී.

## තීරණ අංක 10

අටමුණේ ග්‍රාම සංවර්ධන හා පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටි ඉඩම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරාදීම සම්බන්ධව මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් යොමුකරන ලද ඉල්ලීම් ලිපියට අනුව ,මේ සම්බන්ධව 2025.09.10 ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් මගින් පරීක්ෂාකර බලා ,එම භූමිය අනුරේඛන අංක 2024/34 පිඹුරට අනුව රජය සතු බැවින් එම ඉඩම පැවරීමට අදාලව විරුද්ධත්වයක් නොමැති බව දන්වා යැවීම සුදුසු බවට උක්ත කමිටුව විසින් තීරණය කරන ලදුව එමකමිටු තීරණය සඳහා අනුමැතිය ඉල්ලා විෂය නිලධාරි විසින් ඉදිරිපත් කරන ලිපිය සලකා බැලීමෙන් අනතුරුව ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී.

## තීරණ අංක 11

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ ආපන ශාලාව බදු දීම සම්බන්ධව , නො ,156 ,දකුණු රවුම් පාර ,කුරුණෑගල ලිපිනයේ පදිංචි ඒ.සී .ඒ.කේ.එම්. චන්දන රුක්මන් මහතා වෙත දීර්ඝ කාලීන බදු පදනම යටතේ වසර 03 කාලයක් ආපන ශාලාව බදු දී තිබූ අතර ඊට අදාල බදු ගිවිසුම් කාලය 2022.10.01 දිනෙන් ආරම්භවී 2025.09.30 අවසන් විමට නියමිතව තිබූ නමුත් ගිවිසුමේ ප්‍රකාරව 12 වන කොන්දේසි උල්ලංගනය කිරීම මත 2025.07.31 දිනෙන් බදු කාලය අවසන්කර ඇත. 12 වන කොන්දේසියට ප්‍රකාරව ගිවිසුම කලින් අවසන් කිරීම හේතුවෙන් ඉදිරි මාස 02 කුලී මුදල වන රු.102000 .00 ක මුදල ඔහුගේ ඇප තැම්පත් මුදලින් අයකරගැනීම සම්බන්ධ ලිපිය ආදායම් අංශ ප්‍රධානී ඩී.එච්.එම්.ආර් . දමයන්ති මහත්මිය විසින් කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව,ඒ වෙනුවෙන් තව දුරටත් අය වියයුතු ජල හා විදුලි ගාස්තු පිළිබඳ විස්තරයක් අදාල විෂය නිළධාරිනියගෙන් ලබාගෙන එම ගාස්තු හා කුලී ගාස්තු ඇප තැම්පත් මුදලින් අඩුකරන බවට බදු කරුට දැනුම් දීමෙන් අනතුරුව එම මුදල් හිලව් කරගැනීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී.

## තීරණ අංක 12

වරද්දන කොට්ඨාසයේ මාර්ග කිහිපයක් කැඩී ඇති බැවින් එම මාර්ග මෝටර්ග්‍රේඩර් කර බොරළු දමා සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රී ඩී.එම් දිනූෂා මධුමලි මහත්මිය විසින් එවා ඇති ලිපිය කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පහත සදහන් මාර්ග මෝටර්ග්‍රේඩර්කර බොරළු දමා සංවර්ධනය කර දීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී.

01.දිවුල්ගහපිටිය වත්ත පාලම ලග සිට ගිණිකරාව පාර මැද තිබේන ළිද දක්වා මාර්ගය(ගිණිකරාව වසම)

02.ආදර මාවත මුලසිට කැටගල් අල්ලා තිබේන ස්ථානය දක්වා මාර්ගය (පහළ වරද්දන)

03.විජේරත්න මහතාගේ නිවස අසල සිට පන්සල දක්වා මාර්ගය (ගිණිකරාව වසම )(ඉහල මාර්ගය)

04. අමරසේන මහතාගේ නිවස අසල සිට ප්‍රියත්ත මහතාගේ නිවස දක්වා මාර්ගය (ගිණිකරාව වසම)

05.චන්දන මහතාගේ නිවස අසල සිට හීන් බංඩා මහතාගේ නිවස දක්වා මාර්ගය (ගණිකරාව වසම)බෝගහලන්ද මාර්ගය

## තීරණ අංක 13

වර්සිම් ජාත්‍යන්තර පාසලේ නේවාසිකාගාර වලින් ඉවතලන ආහාර අපද්‍රව්‍ය බැහැර කර ගැනීම සඳහා පහසුකම් සපයා ගැනීම පිළිබඳ පාසලේ විදුහල්පති තුමා එවා ඇති ලිපිය සලකා බැලීමෙන් අනතුරුව මේ සම්බන්ධ කමිටුවක් මගින් පරික්ෂාකර බලා ,ලබාදුන් වර්තාව විෂය නිලධාරි විසින් කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව උක්ත කමිටුව විසින් පෙන්වා දී ඇති කමිටු නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී.

## තීරණ අංක 14

නිසි පරිදි මුද්දර ගාස්තු ගෙවා නොමැති බවට සහතික කළ විකුණුම් හා තෑගි ඔප්පු සම්බන්ධයෙන් පමණක් පළාත් පාලන ආයතන මගින් කටයුතු කිරීම සම්බන්ධව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කර ඇති ලිපිය ආදායම් අංශ ප්‍රධානි රේණුකා දමයන්ති මහත්මිය විසින් කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ,නිසි පරිදි මුද්දර ගාස්තු ගෙවා නොමැති විකුණුම් හා තෑගි ඔප්පු සම්බන්ධයෙන් පළාත් ආදායම් කොමසාරිස් විසින් 2025.01.03 දිනැති ලිපියෙන් දක්වා ඇති පරිදි 1990 අංක 08 දරණ වයඹ පළාත් මුදල් ප්‍රඥප්තියේ 54 ,60 සහ 68 වන වගන්ති ප්‍රකාරව කටයුතු කරමින් සභාවේ සෑම අංශයක් වෙතම ඉදිරිපත් කරන ඔප්පු සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා එකී ඔප්පු පළාත් ආදායම් කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු බවත් ,ඔප්පු සම්බන්ධයෙන් කටයුතු කරන සෑම නිලධාරියෙක්ම දැනුවත් කිරිම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී.

## තීරණ අංක 15

මාස්පොත මහජන සෞඛ්‍ය පරීක්ෂක සඳහා කාර්යාලයක් පවත්වාගෙන යාමට ස්ථානයක් ලබා ගැනීම සම්බන්ධව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් ඉදිරිපත්කර ඇති ලිපිය කාරක සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව ,කුඩාගල්ගමුව උපකාර්යාලයේ ඉහල මාලයේ සභාපතිවරයා සඳහා ඉදිකර ඇති කාමරය පමණක් ගිවිසුමකට යටත්ව ලබාදීමටත්,මෙම ගිවිසුමේ විශේෂයෙන් සඳහන් කලයුතු කාරණයක් වන්නේ ප්‍රාදේශිය සභාවට අවශ්‍ය වන්නාවූ යම්කිසි අවස්ථාවක දී එය නැවත ලබාදීමේ එකඟතාවය මත ලබාදිම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී.

## තීරණ අංක 16

මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් කුලී පදනම මත ලබාගැනීම සම්බන්ධව යන්ත්‍රෝපකරණ අධිකාරිය මගින් එවා ඇති ලිපිය කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මහජනතාවගේ ඉල්ලීම් සලකා බලා යන්ත්‍රෝපකරණ අධිකාරියට අයත් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් කුලී පදනමට ලබාගැනීමටත් ඒ සඳහා අදාලවන්නා වූ ගාස්තු පිළිබඳ විස්තරයක් ගෙන්වා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී.